# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,957 - 2016 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2016.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය | 182 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය | 183 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය | — |
| රජයේ නිවේදන | 183 |
| මිල පාලන දැන්වීම් | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | 187 |
| නැවියන්ට දැන්වීම් | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මාර්තු මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මාර්තු මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

181 – B 081035 —402 (2016/03)

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 192

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිලයේ ස්ථිර කිරීමක්

*2015 දෙසැම්බර් මස 26 වැනි දින සිට ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් ඃ*

ලුතිනන් (ඉ) [තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) ] කටුකුරුන්දේ මුහන්දිරම්ලාගේ චමින්ද ලාල්, එන්ආර්ඊ 1819, ශ්‍රීලංනාහ,

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි.
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

03 - 50

2016 අංක 193

MOD/DEF/03/02/PRO/RNF/01/07.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

*2016 ජනවාරි මස 13 වැනි දින සිට තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (ඉ) වශයෙන් ඃ*

ලුතිනන් (ඉ) පල්ලිමුල්ල කපුගමගේ චමිදු චන්දිමාල්, එන්ආර්ඊ 2419 ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි.
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

03 - 49

---

2016 අංක 194

MOD/DEF/03/02/VNF/COM.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම

*2016 ජනවාරි මස 08 වැනි දින සිට උප ලුතිනන් (ස්වේච්ඡා) වශයෙන් ඃ*

වාගොත්තර හංගිලි ගෙදර දර්ශිකා ඉංදුමාලි විජේවර්ධන, එන්වීඑක්ස් 5832, ශ්‍රීලංස්වේනාහ
නවගමුව දිසානායකලාගේ කාන්චනා ප්‍රියදර්ශනී, එන්වීඑක්ස් 5833, ශ්‍රීලංස්වේනාහ
කොඩිතුවක්කු ආරච්චිල්ලාගේ ජයමිණි හර්ශනී කොඩිතුවක්කු, එන්වීඑක්ස් 5834, ශ්‍රීලංස්වේනාහ
අලංකාර ගෙදර විදූෂා ප්‍රභාදී ජයසිංහ, එන්වීඑක්ස් 5835, ශ්‍රීලංස්වේනාහ
හේනක ආරච්චිලාගේ ක්‍රිෂාන්ත ලක්මාල්, එන්වීඑක්ස් 5836, ශ්‍රීලංස්වේනාහ
ඇල්ලපිටදෙනියේ ගෙදර නිරෝෂා ලක්මාලි ඇල්ලපිටදෙනිය, එන්වීඑක්ස් 5837, ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි.
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 11 වැනි දින,
කොළඹ දී ය.

03 - 96

# වෙනත් පත්කිරීම් ආදිය

2016 අංක 195

**අධිකරණ අමාත්‍යාංශය**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(3) වෙනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව අධිකරණ අමාත්‍ය විජයදාස රාජපක්ෂ වන මම පහත උපලේඛනයේ සඳහන් නීතිඥවරුන් අදාළ අධිකරණ කොට්ඨාශ සඳහා සමාදාන විනිශ්චයකාරවරුන් සහ නිලනොලත් මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් පත්කරමි.

විජයදාස රාජපක්ෂ,
අධිකරණ අමාත්‍ය.

2016 පෙබරවාරි මස 12 වැනි දින,
කොළඹ 12
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

| *අනු. අංකය* | *නම* | *ලිපිනය* | *අධිකරණ කොට්ඨාසය* |
|---|---|---|---|
| 1 | නීතිඥ හීනටිගල වීබද්දගේ පුණ්‍යදාස පියසේන මහතා | අංක.341/6ඒ, වක්වැල්ල පාර, ගාල්ල | ගාල්ල |
| 2 | නීතිඥ ස්ටීවන් අතුකෝරල මහතා | අංක.68/ඊ, මුල්ලේරියාව උතුර, මුල්ලේරියාව නව නගරය | කඩුවෙල |
| 3 | නීතිඥ ඉඩමේ කෝරාළලාගේ අබේරත්න බණ්ඩාර මහතා | අංක. 129/2බී, අනගාරික ධර්මපාල මාවත, මහනුවර. | මහනුවර |
| 4 | නීතිඥ මැණික් අච්චිගේ ලයනල් ගුණවර්ධන මහතා | කජුගහවත්ත, මාබොදල, වේයන්ගොඩ. | මීනුවන්ගොඩ |
| 5 | නීතිඥ සංජීව අනුරාධ ඇන්තනී මහතා | සී4-ජී-1, සොයිසා මහල් නිවාස, රත්මලාන. | කොළඹ |
| 6 | නීතිඥ කෝන්ගලගේ උත්පල් සුරාජ් නිශේන්ද්‍ර මහතා | අංක 6/77, ඇල්බියන් පටුමග, දෙමටගොඩ, කොළඹ 09. | කොළඹ |
| 7 | නීතිඥ මිගෙල් ආරච්චිගේ රොෂාන් ප්‍රසාද් සිල්වා මහතා | අංක. 149/16, තෙලඟපාත පාර, වත්තල. | කොළඹ |
| 8 | නීතිඥ හේරත් මුදියන්සේලාගේ ජීව මහේෂ් හේරත් මහතා | අංක.64, පන්සල පාර, ඉහලගම, ගම්පහ. | ගම්පහ |
| 9 | නීතිඥ බන්දුලගේ සුමතිපාල රත්නායක මහතා | අංක. 346/3, ඇස්වත්ත උතුර, පුවක්පිටිය. | අවිස්සාවේල්ල |
| 10 | නීතිඥ අබ්දුල් රහීම් මුහම්මඩ් සුල්පි මහතා | අංක. 54 C, අල් - මනාර් පාර, මරුදමුනේ (32314), කල්මුණේ | කල්මුණේ. |
| 11 | නීතිඥ ෆලීල් මවුලානා අමීරුල් අන්සාර් මහතා | අංක.174, හිජ්රා පටුමග, මරුදමුනේ 03. (32314) | කල්මුණේ |
| 12 | නීතිඥ මනෝජ යුගීෂ්වර ජයනෙත්ති මහතා | "අනෝමා", අංක. 64/10, දෙහිවල පාර, බොරලැස්ගමුව. | ගල්කිස්ස |

02 - 43

---

# රජයේ නිවේදන

**1941 අංක 39 දරන ණයසහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම**

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත් අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු, ණයහිමි යන දෙපක්ෂය අතරේ බේරුමක් ඇතිකිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණයතුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණයහිමියන් වෙත ආඥා පනතේ 25 (1), 26 (1) වගන්ති යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. කේ. රත්නසූරිය මිය,
ලේකම් (වැ.බ),
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2016 ජනවාරි,
ණය සහනදායක මණ්ඩලීය දෙපාර්තමේන්තුව,
අංක 35ඒ,
ආචාර්ය එන්. එම්. පෙරේරා මාවත,
කොළඹ 08.

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (01)<br>43745 | ලංකේෂ්වරගේ අජන්ත උපුල්සිරි මයා,<br>අංක 277/ඊ,<br>ශ්‍රී සෝමානන්ද මාවත,<br>වෑවිට,<br>බණ්ඩාරගම.<br><br>වන්නිආරච්චිගේ ගුණවතී පෙරේරා මිය,<br>අංක 277/ඊ,<br>ශ්‍රී සෝමානන්ද මාවත,<br>වෑවිට,<br>බණ්ඩාරගම. | හෙට්ටිආරච්චිගේ ෂෙහාරා දිල්හානි පෙරේරා මිය,<br>අංක 07,<br>ජය මාවත,<br>කෙසෙල්වත්ත,<br>පානදුර. |
| (02)<br>41527 | අරඹගේ විමලසුන්දර මයා,<br>මඩවලපතල,<br>මහගම. | මලවිතන්ත්‍රි චන්දන පුෂ්ප කුමාර මයා,<br>ගොඩකුඹුර,<br>මහගම. |
| (03)<br>43746 | වනිගසේකරආරච්චිගේ මනෝජා දිල්රුක්ෂි මිය,<br>අංක 226,<br>කුඩාපන්විලවත්ත, ඕපාත,<br>කොටුගොඩ. | ජයමාන්න මොහොට්ටිගේ දෝනස්ටෙලා කුසුම්කාන්ති මිය,<br>අංක 53/33,<br>ද ෆිනෑන්ස් වත්ත,<br>උතුරු බටගම,<br>කඳාන. |
| (04)<br>43669 | එදිරිසිංහ අතුකෝරලගේ සුමිත් මයා,<br>සමඟි මාවත,<br>මොරපිටිය. | වෑත්තෑව කංකානම්ගේ මහේෂ් දිල්හාන් මයා,<br>අංක 15/4,<br>ඉහලවත්ත,<br>නෑබඩ පාර, මතුගම. |
| (05)<br>43603 | මිල්ලගහ ගෙදර ජයන්ත චන්ද්‍රසේකර මයා,<br>අංක 12/6/2, කේ. බී. මැදිවක මාවත,<br>උඩදුම්බර. | එදිරිසිංහ මුදියන්සේලාගේ මල්ලිකා කුමාරි එදිරිසිංහ මිය,<br>අංක 56,<br>මිනුවන්ගොමුව,<br>ගලපිටගම, බෝපාත. |
| (06)<br>43804 | ගුණතිි කුලතුංග සිල්වා මයා,<br>අංක 324/I,<br>ඉහල බියන්විල,<br>කඩවත. | ලේල්වල අප්පුහාමිලගේ දොන් සුනිමල් සෙනරත් මයා,<br>අංක 75/18,<br>ලියෝ මාවත,<br>සිංහාරමුල්ල,<br>කැළණිය. |
| (07)<br>43696 | රිටිගහවත්ත ආරච්චිලාගේ ලලිත් ගාමිණී<br>ගුණසේකර මයා,<br>මැදහින්නවත්ත,<br>ගනේපල්ල,<br>තැලිගම. | අම්බලන්ගොඩ මහවඩුගේ මෙඩ්වඩ් සනීපීරිස් මයා,<br>බිලිංගහහේන,<br>තුංකිද,<br>තැලිගම. |
| (08)<br>43663 | වෙනියත්තා රාසම්මා හෙවත් රාසම්මා<br>වෙනියත්තන් මිය,<br>අංක 38/25,<br>බෝධිරාජාරාම පටුමග,<br>කොළඹ 13. | අබ්දුල් කාදර් මොහොමඩ් සනූර්දීන් මයා,<br>අංක 38/14,<br>බෝධිරාජාරාම පටුමග,<br>කොළඹ 13. |
| (09)<br>40567 | මුණීවරතන්ත්‍රී සුනිල් ද සිල්වා මිය,<br>අංක 156/06,<br>කුරිකොටුව,<br>වේයන්ගොඩ. | හපුආරච්චිලාගේ නෙවිල් කිංස්ලි මයා,<br>අංක 200සී,<br>තල්ගස්මොටේ,<br>මොට්ටුන්න,<br>වේයන්ගොඩ. |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| (10) 43721 | ශ්‍රීයානි මල්ලිකා ගොඩගම්පල මයා, අංක 05, සිල්වා මාවත, මිනුවන්ගොඩ. | දිස්නා රංජනී අමරසිංහ මිය, අංක 293/4, අඹ සෙවන, නිල්පනාගොඩ, මිනුවන්ගොඩ. |
| (11) 43718 | සපුතන්ත්‍රීගේ දෝන ප්‍රියන්ති ශ්‍රියාදනි නොහොත් සපුතන්ත්‍රීගේ ශෙරීන් ප්‍රියන්ති ශ්‍රියාදනි මිය, අංක 40, බුවනෙකබා මාවත, කෝට්ටේ. | තෙල්ගේ මල්ලිකා නාලනී පීරිස් මිය, දෙනවක, උඩගම, කාමරන්ගාපිටිය, පැල්මඩුල්ල. |
| (12) 41054 | ලියනතන්තිරි ගමගේ බාලහාමි මිය, අංක 01, 4වන පටුමග, සමන්පුර, අඟුලාන දුම්රිය පොල පාර, මොරටුව. | හක්මනදූර සුගතපාල මයා, අංක 7/1, වීරසේන සිල්වා මාවත, කල්දෙමුල්ල, මොරටුව. |
| | කලාදුගොඩ රණසිංහ කන්කානම්ගේ ඉන්දික පුෂ්පකුමාර මයා, අංක 01. 4 වන පටුමග, සමන්පුර, අඟුලාන දුම්රිය පොල පාර, මොරටුව. | |
| (13) 43651 | අරඹවත්තගේ ජස්ටින් රුදිගු මයා, අංක 80. ඉහල තල්දූව, අවිස්සාවේල්ල. | යටන්වල ගමරාලලාගේ විදුරන්ග නදීප යටන්වල මයා, අංක 63, ඉහල තල්දූව, අවිස්සාවේල්ල. |
| (14) 43615 | කොස්ම පටබැඳිගේ මරීනා රොෂානි දල්පතාදු විවාහයට පසු පීරිස් මිය, අංක 109/ඒ/2. කඩවත, උල්හිටියාව, වෙන්නප්පුව. | කේතගේ තනුජ සම්පත් ප්‍රනාන්දු මයා, අංක 88/2, හලාවත පාර, කට්ටුව, මීගමුව. |
| (15) 42757 | බමුණු මුදියන්සේලාගේ බුද්ධිකා අනුරුද්ධිකා මිය, ගිරාතලාන උතුර, හෙට්ටිපොල. | දිසානායක මුදියන්සේලාගේ රෝහණ විමල් දිසානායක මයා. බමුණුමුල්ල පාර, හිරිපොකුණ, හෙට්ටිපොල. |
| (16) 43652 | සූරිය මුදියන්සේලාගේ බන්දුලසේන මයා, නව සිගහවත්ත, වැලිපැන්නගහමුල්ල. | මාරවිල මැනේජ්මන්ට් සර්විස් පුද්ගලික සමාගම, පල්ලිය පාර, මාරවිල. |
| (17) 43523 | පාදුක්කගේ කල්‍යාණවතී මිය, අංක 86, කිරිබත්ගොඩ, කැළණිය. | ලංකා සෙන්ට්‍රල් නිවාස දේපළ වෙළඳාම් සමාගම, අංක 60, නුවර පාර, කිරිබත්ගොඩ. |
| (18) 43660 | වික්‍රම ආරච්චිලාගේ මාලා මාග්‍රට් මිය, අංක 43. තිස්ස මාවත, ඇඹරළුව උතුර, වැලිවේරිය. | ජයසිංහ මුදලිගේ චම්පා කුමුදුනී මිය, අංක 213. නන්දා මාවත, කොළඹ පාර, බැන්ඩියමුල්ල, ගම්පහ. |

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමියාගේ නම සහ ලිපිනය |
|---|---|---|
| | ගනේපොල ආරච්චිලාගේ ඉෂාර දිල්රුක්ෂි ගනේපොල මිය,<br>අංක 43,<br>තිස්ස මාවත,<br>ඇඹරළුව උතුර, වැලිවේරිය. | |
| | ගනේපොල ආරච්චිලාගේ යෂිකා රෂ්මි ගනේපොල මිය,<br>අංක 43,<br>තිස්ස මාවත,<br>ඇඹරළුව උතුර, වැලිවේරිය. | |
| (19)<br>43640 | රණසිංහ ආරච්චිගේ සංජීව මයා,<br>අංක 218,<br>කොස්කනත්ත පාර,<br>මාම්පේ උතුර, පිළියන්දල. | පරණ හේවාගේ ඉන්ද්‍රානි මිය,<br>අංක 87,<br>කොස්කනත්ත පාර,<br>මාම්පේ, පිළියන්දල. |
| (20)<br>43711 | මදර සිංහ ගමගේ සුදේශ් මයා,<br>අංක 04,<br>පොකුණ පාර,<br>මංත්‍රිමුල්ල,<br>අත්තිඩිය. | දොන් දීප්ති කුමාර් රණසිංහ මයා,<br>අංක 297,<br>මූකලන්ගමුව,<br>සීදූව. |
| (21)<br>43681 | සුබසිංහ ආරච්චිගේ ජයන්තා මාලනී මිය,<br>ළිද ලඟ නිවස,<br>ගොන්නව,<br>බමුණාකොටුව. | නයනා ප්‍රීතිකා කොලොන්නේ මිය,<br>අංක 1055, උඩකුඹුර පාර,<br>කොහොඹපොල,<br>පන්නල. |
| (22)<br>43557 | පනාගොඩගේ සුරාන් අසංක ප්‍රනාන්දු මයා,<br>අංක 27/1.<br>සීවලි මාවත,<br>විල්ලෝරාවත්ත,<br>මොරටුව | විරහැන්නැදිගේ ජෙනට් ප්‍රනාන්දු මිය,<br>අංක 02,<br>අර්නස්ට් පෙදෙස,<br>රාවතාවත්ත,<br>මොරටුව. |
| | පනාගොඩගේ ස්ටැන්ලි ජොෂප් ප්‍රනාන්දු මයා,<br>අංක 27/1,<br>සීවලී මාවත,<br>විල්ලෝරාවත්ත,<br>මොරටුව. | |
| | විරහැන්නැදිගේ ජසින්තා ඉන්ද්‍රානි ප්‍රනාන්දු මිය,<br>අංක 27/1,<br>සීවලි මාවත,<br>විල්ලෝරාවත්ත,<br>මොරටුව. | |
| (23)<br>42333 | වීරරත්න මාතර මහවිදාන මුහම්දිරම්ගේ දයානන්ද මයා,<br>අංක 130,<br>බොරාල පාර,<br>වැල්ලවත්ත, වැලිගම. | සුරංග ප්‍රසාද් හීනැටිගල මයා,<br>අංක 22,<br>අග්‍රබෝධි මාවත,<br>වැලිගම. |
| (24)<br>39412 | අළුත්ගේ දෝන සීලවතී මිය,<br>අංක 78.<br>සල්මල්වත්ත,<br>පැපිලියාන,<br>බොරලැස්ගමුව. | යහම්පත් ආරච්චිගේ දෝන ධර්මවතී මිය,<br>අංක 92,<br>ඩබ්. ඒ. ඩී, රාමනායක මාවත,<br>කොළඹ 02. |
| | | විනීතා මල්කාන්ති හුලංගමුව මිය,<br>අංක 24/25,<br>පුරාණ විහාර මාවත,<br>පාමංකඩ, කොළඹ 06. |

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - අම්පාර ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.10.05 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0910-01978415-001

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. ශ්‍රියානි ගුණරත්න විසින් සහතික කරන ලද 2012 මැයි මස 30 දිනැති අංක 154 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, අම්පාර පදිංචි සදුන් ඉලන්ගමගේ සහ අසංග ඉලන්ගමගේ යන අය බන්ධනදයින් වශයෙන් රුපියල් එක්කෝටි අනූහත් ලක්ෂ අසූතුන් දහස් අටසිය පනස් නවයයි ශත පනස් අටක (රු. 1,97,83,859.58) මුදලක්, 2015 මාර්තු මස 10 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 1,97,83,859.58 මුදල, 2015 මාර්තු මස 11 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, වර්ෂයකට සියයට විස්ස (20%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 154 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර චන්දිමා ප්‍රියදර්ශනී ගමගේ මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පානම පත්තුවේ, පොතුවිල් ගමේ පිහිටි ඉන්ස්පෙක්ටර් ඊදම් නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පටු මග ද, නැගෙනහිරට : පාර ද, දකුණට : සාර්ලිස් සිල්වා විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : සෝමවතී විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසි අටක් (අ. 0, රූ. 3, පර්. 28) ක් විශාල, ඉඩම මෙම අම්පාර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව බී 53/21 හි ලියා පදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම නැවත මැනීමකින් පසු පහත සඳහන් පරිදි විස්තර කර ඇත :

නැගෙනහිර පළාතේ, අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ, පානම් පත්තුවේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසයේ පොතුවිල් ප්‍රාදේශීය සභා සීමාව තුළ පොතුවිල් ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. පී. මොහමඩ් ටැයුබ් විසින් සාදන ලද 2011.03.10 දිනැති අංක එම්ටී/107/11 සැලැස්මේ නිරූපනය වන ඉන්ස්පෙක්ටර් ඊදම් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර ද (පීඑස්), නැගෙනහිරට : පාර ද (ආර්ඩීඒ) සහ වෙන්කළ ඉඩම ද, දකුණට : සාර්ලිස් සිල්වා විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : එම්. කමලාවතී විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද යන මායිම් තුළ රූඩ් තුනයි පර්චස් විසි අටක් (අ. 0, රූ. 3, පර්. 28) හෙක්ටයාර 0.3743ක් විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැව් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

03 - 95

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධිත ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2015.08.26 දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2013.06.21 දිනැති අංක 590 දරන උකස් බැඳුම්කරය මත 2015.06.30 දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් පනස්අට ලක්ෂ හත්දහස් හයසිය අනූහයයි ශත තිස් හයක (රු. 58,07,696.36) මුදල සමග රුපියල් පනස් පන් ලක්ෂ තිස්එක් දහස් අටසිය එකයි ශත නවයක (රු. 55,31,801.09) මුදලක් මත වසරකට සියයට එකොළහ (11%) බැගින් 2015.07.01 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොලියද වත්තල, හැඳල, කෙරවලපිටිය, පොකුණ පාරේ අංක 39/9හි එස්. සසීන්ද්‍රන් මහතා සහ විසාලච් ගයාත්‍රි සසීන්ද්‍රන් මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. අංක 590 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් පනස් අට ලක්ෂ හත්දහස් හයසිය අනූහයයි ශත තිස් හය (රු. 58,07,696.36)ක මුදල සමග 2015.07.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥ පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥ පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, පිටුකොටුව ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රයිගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභාවේ, හැඳල උප කාර්යාලයේ සීමාව තුළ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 172B දරන නායක්කන්ද

ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ හැඳල පිහිටි පොකුණ පාරේ දැනට වරිපනම් අංක 47/08 දරන පිහිඹියාගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. සී. එස්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1983 මාර්තු මස 18 දිනැති අංක 62/1983 දරන එහෙත් 1963.03.18 දිනැති අංක 62/1963 ලෙස ලියාපදිංචිව ඇති පිඹුරෙහි ලොට් 12 ලෙස දක්වා සීමා නිරණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : මෙහි ලොට් 1, නැගෙනහිරට : ලොට් 4 (අඩි 12 පළල පාරට වෙන් කළ කොටස) ද, දකුණට : මෙහි ලොට් 3 ද සහ බස්නාහිරට : හෙට්ටිගේ චාර්ලිස් පෙරේරාගේ ඉඩම ද මායිම්ව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් හා සියලු දේ සමග වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 36/100 හි ලියාපදිංචි කර ඇත.

ලොට් 2 ලෙස දක්වා ඇති ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1985 නොවැම්බර් මස 30 දිනැති අංක 8650 දරන පිඹුරෙහි පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී හැඳල පිහිටි පොකුණ පාරේ, දැනට වරිපනම් අංක 47/08 දරන පිහිඹියාවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1985 නොවැම්බර් මස 30 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : එම ඉඩමේ ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 4 (අඩි 10 පළල පාරට වෙන් කළ කොටස) ද, දකුණට : එම ඉඩමේ ලොට් 3 ද සහ බස්නාහිරට : හෙට්ටිගේ චාර්ලිස් පෙරේරාගේ ඉඩමද මායිම් එකී අංක 8650 දරන පිඹුරට අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි පිහිටි සියලු දේ සමග වේ.

### දෙවන උපලේඛනය

එකී හැඳල පිහිටි පොකුණ පාරේ පිහිඹියාවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1983 මාර්තු මස 18 දිනැති අංක 62/1983 දරන පිඹුරෙහි (එහෙත් 61/1983 ලෙස ලියාපදිංචිව ඇති) ලොට් 4 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට : පොකුණ පාර ද, නැගෙනහිරට : දැන් අනුලා ගුණසේකරට අයත් ඉඩම ද, දකුණට : ලොට් 3 ද සහ බස්නාහිරට : ලොට් 1 හා 2 මායිම්ව පර්චස් හයයි දශම හතයි පහක (අ. 0, රූ. 0, පර්. 6.75) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 36/36 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. කොඩිතුවක්කු මහතා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්).

ලංකා බැංකුව,
පිටකොටුව.

03 - 109

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

2016.01.21 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් බී. බී. රණසිංහ විසින් සහතික කරන ලද 2000.05.11 දිනැති අංක 3779 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2013.08.30 දිනැති අංක 609 දරන අතිරේක උකස් බැඳුම්කරය අනුව 2015.12.31 වැනි දින තෙක් ප්‍රතිලේඛනගත ණය (A) මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැත්තෑ නවලක්ෂ හත්දහස් අනූපහයි ශත විසිඅටක (රු. 79,07,095.28) මුදල සමග ප්‍රතිලේඛනගත ණය (B) මත රුපියල් දොළොස් ලක්ෂ හැටඑක් දහස් දෙසිය අසූහතයි ශත විසිදෙකක (රු. 12,61,287.22) මුදල සමග ප්‍රතිලේඛනගත ණය (A) මත රුපියල් හැටදෙලක්ෂ හතළිස්හය දහස් හයසියයක (රු. 62,46,600.00)ක මුදල මත වසරකට සියයට එකොළහ (11%) බැගින් තවදුරටත් පොලිය ද ප්‍රතිලේඛනගත ණය (B) මත රුපියල් එකොළොස් ලක්ෂ පනස්තුන්දහසක (රු. 11,53,000.00) මුදල මත වසරකට සියයට හතර (4%) බැගින් පොළියක් ද, 2016.01.01 සිට ගෙවීම නිම කරන දිනය තෙක් රාජගිරිය, මැද වැලිකඩ පාරේ, 1 වන පටුමගෙහි, අංක 37/3හි උදාර ඕෂන් ෆුඩ්ස් වෙතින් අයවිය යුතුව ඇත.

2. අංක 3779, 609 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රු. 91,68,382.50 (රුපියල් අනූඑක් ලක්ෂ හැට අට දහස් තුන්සිය අසූදෙකයි ශත පනහක් පමණි) මුදල සමග 2016.01.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥ පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, පිටුකොටුව ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිර ගැනීම්) හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොච්චිකඩේ දකුණ, කොට්ඨාස අංක 19හි ශාන්ත සෙබස්තියන් ග්‍රාමයෙහි පිහිටි බලයලත් මිනින්දෝරු හා තලම්තිකරු ඒ. ජේ. බී. විජේකෝන් විසින් සාදන ලද 1987 පෙබරවාරි 15 දිනැති අංක 5/87 දරන පිඹුරෙහි ලොට් A ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් A උතුරට : ප්‍රයිස් පෙදෙස ද, නැගෙනහිරට : අංක 5/87 දරන එකී පිඹුරෙහි ලොට් B ද , දකුණට : අංක 5/87 දරන පිඹුරෙහි ලොට් C ද සහ බස්නාහිරට : ඩයස් පෙදෙසෙහි වරිපනම් අංක 47 දරන "පන්සල" ද මායිම්ව එකී අංක 5/87 දරනස පිඹුරට අනුව පර්චස් තුනයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 3.08) හෙවත් හෙක්ටයාර් 0.078ක බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ ද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 792/298 හි ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ කොච්චිකඩේ දකුණ, කොට්ඨාස අංක 19හි ශාන්ත සෙබස්තියන් ග්‍රාමයෙහි පිහිටි බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු ඒ. ජේ. බී. විජේකෝන් විසින් සාදන ලද 1987 පෙබරවාරි 15 දිනැති අංක 5/87 දරන පිඹුරෙහි ලොට් B ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් B උතුරට : ප්‍රයිස් පෙදෙස ද, නැගෙනහිරට : අලුත් පාර ද , දකුණට : අංක 5/87 දරන පිඹුරෙහි ලොට් C ද සහ බස්නාහිරට : එකී අංක 5/87 දරන පිඹුරෙහි ලොට් A ද මායිම්ව එකී අංක 5/87 දරන පිඹුරට අනුව පර්චස් තුනයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, පර්. 3.08) හෙවත් හෙක්ටයාර් 0.078ක බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 792/299 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. කොඩිතුවක්කු,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකර ගැනීම්).

ලංකා බැංකුව,
පිටකොටුව.

03 - 111

---

**සෙලාන් බැංකුව පීඑල්සී - කොළඹ කොටුව ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.01.21 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0300 - 32395874 - 001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ඩී. මුණසිංහ විසින් දෙකම සහතික කරන ලද 2011 ජුනි මස 10 දිනැති අංක 04 සහ 05 සහ ප්‍රසිද්ධ නොතාරිස් විරාජ් වික්‍රමරත්න විසින් සහතික කරන ලද 2009 ඔක්තෝබර් මස 29 දිනැති අංක 250 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ ලියාපදිංචි අංක ඩබ්ලිව්ජ්/85378 දරන 2007 අංක 7 දරන නව සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන මෙසස් කවිනි ඉම්පෝට්ස් ඇන්ඩ් එක්ස්පෝට්ස් යන අය බන්ධනදයීන් වශයෙන් එකී බැඳුම්කරන මත වාර ණය පහසුකම සම්බන්ධයෙන් රුපියල් හැටතුන්ලක්ෂ අටදහස් නවසිය පනස් හතයි ශත අනූතුනක (රු. 63,08,957.93) මුදලක්, 2015 ජුනි මස 07 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 63,08,957.93 සහ 2015 ජුනි මස 08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, පෙරකී මූල්‍ය පහසුකම් මත වර්ෂයකට සියයට දහඅට (18%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 04, 250 සහ 05 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ ඉහළ ඉඹුල්ගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඩී. සී. කුලතුංග විසින් සාදන ලද 2009 සැප්තැම්බර් මස 10 දිනැති අංක 1612 දරන සැලැස්මේ නිරූපිත ගොන්නගහවත්ත නැමති ඉඩමේ ලොට් 3බී ලකුණු කල බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක 1610 දරන සැලැස්මේ ලොට් 4 සහ අංක 1610 දරන සැලැස්මේ ලොට් 3ඒ ද, නැගෙනහිරට : එම්. ජී. තිලකරත්නට හිමි ඉඩම ද, දකුණට : මෙම ඉඩමේ ලොට් බී සහ බස්නාහිරට : අංක 1610 සැලැස්මේ ලොට් 2 සහ ලොට් 4 ද යන මායිම් තුළ එකී අංක 1612 දරන සැලැස්ම අනුව පර්චස් දහ අටයි දශම හතයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 18.70) ක් විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සහිත ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෞශල්‍යා හැව් මිය,
දෙපාර්තමේන්තු ප්‍රධානී - නීති.

03 - 151/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - මාවනැල්ල ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනාව

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.01.21 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0480 - 33548292 - 001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව්9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. පී අයි. ගම්ලත් විසින් දෙකම සහතික කරන ලද 2013 ජුනි මස 13 දිනැති අංක 2447 සහ 2014 මැයි මස 13 දිනැති අංක 2610 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මාවනැල්ලේ ඊස්ටන් වර්ල්ඩ් (පීවීටී) ලිමිටඩ් යන අය බන්ධනදයීන් වශයෙන් රුපියල් පන් කෝටි හැටතුන් ලක්ෂ අනූනව දහස් පන්සිය

තිහයි ශත අසූ තුනක (රු. 5,63,99,530.83) මුදලක්, 2015 ජුනි මස 17 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 5,63,99,530.83 මුදල ද, 2015 ජුනි මස 18 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, වර්ෂයකට සියයට පහළොවක් (15%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 2447 සහ 2610 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රයන් බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ. පානම පත්තුවේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොතුවිල් ප්‍රාදේශීය සභා සීමාව තුළ පොතුවිල් ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ටී. එම්. ශහීට් විසින් සාදන ලද 2013.03.12 දිනැති අංක 2013/501 සැලැස්මේ නිරූපනය වන උල්ලයික්කඩු නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : පී. රාළහාමි හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : පාර (ආර්.ඩී.ඒ.) සහ වෙන්කල ඉඩම ද, දකුණට : එම්. අයි. එම්. සිද්දික් සහ තවත් අය හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : පී. රාළහාමි විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද යන මායිම් තුළ (අ. 01, රූ. 0,2 පර්. 0) ක් නොහොත් හෙක්ටයාර් 0.6072 විශාල, එහි පිහිටි වෙනත් සියලු දේ සහිත ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මිය,
සහකාර සාමාන්‍යාධිකාරිනී - නීති.

03 - 151/2

---

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

වයි. එම්. ඩී. එම්. ආර්. එස්. බී. යටවර සහ ඒ. බී. යටවර.
ගිණුම් අංක : 0150 5000 1293.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 ක් වූ නොවැම්බර් මස 26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. වීබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2011 දෙසැම්බර් මස 12 දාතම හා අංක 2212 සහ 2012 සැප්තැම්බර් මස 19 දාතම හා අංක 2601 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි පළමු උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළවල බඳුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, යටවර මහ දිසානායක මුදියන්සේලාගේ රුචිර සම්පත් බණ්ඩාර යටවර සහ අබේරත්න බණ්ඩාර යටවර යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 2212 සහ 2601 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකා මුදලින් රුපියල් එක්කෝටි හැට අට ලක්ෂ හැට හතර දහස් නමසිය අනූ එකයි ශත හැත්තෑ අටක (රු. 1,68,64,991.78) මුදලක් 2015 ඔක්තෝබර් මස 08 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද, එකී රුපියල් එක්කෝටි හැට අට ලක්ෂ හැට හතර දහස් නමසිය අනූ එකයි ශත හැත්තෑ අටක (රු. 1,68,64,991.78) මුදලද, 2015 ඔක්තෝබර් මස 09 දින සිට අංක 2212 සහ 2601 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි පනස් නම ලක්ෂ අසූ හතර දහස් නවසිය පනහයි ශත හතළිස් පහක (රු. 1,59,84,650.45) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ දහයක් (10%) හා රුපියල් දෙලක්ෂ හැත්තෑ පන් දහසක (රු. 2,75,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහයක් (10%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 2212 සහ 2601 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හේවාහැට ගම්දහය කෝරළේ, පහත හේවාහැට ප්‍රාදේශීය සභා සීමාවන් තුළ බෝලපේ ග්‍රාමයේ පිහිටි "ලුණුවැල්ල එස්ටේට්" යැයි කියනු ලබන ඉඩමට (පිඹුරු අංක 4198 හි ලොට් 1 සහ 2A ඒකාබද්ධයක් වන) බලයලත් මානක තැන එන්. සේනාරත්න යන අය විසින් සාදන ලද 2006 දෙසැම්බර් මස 11 සහ 16 දාතම හා අංක 1357 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලුණුවැල්ල එස්ටේට් යන රජයේ ඉඩමේ කොටසක්. නැගෙනහිරට : ලෙච්චමීවත්ත එස්ටේට් ඉඩමේ හරගම ග්‍රාමය, දකුණට : ඒකනායක යන අය විසින් හිමිකම් කියනු ලබන ලුණුවැල්ල එස්ටේට් හි කොටසක් සහ බස්නාහිරට : මහනුවර සිට මරස්සන දක්වා පාර යන මායිම් තුල පිහිටි ප්‍රමණයෙන් අක්කර අටයි රූඩ් දෙකයි පර්චස් තිස් හතක් (අ. 8, රූ. 2, පර්. 37) හෝ හෙක්ටයාර 3.5334ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, ජල පොම්පය සහ ඒ සී ජෙනරේටරය සහ එහි පිහිටි සෑම සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශ්‍යතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන්ද සමග එකී අංක 1357 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහත සඳහන් ඉඩමේ නැවත මිනුමකි :

එකී බෝලපේ ග්‍රාමයේ පිහිටි "ලුණුවැල්ල එස්ටේට්" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ෆ්‍රැන්සිස් මාපලගම යන අය විසින් සාදන ලද 1966 ජනවාරි මස 11 දාතම හා අංක 4198 දරන පිඹුරේ නිරූපිත සීමා නීර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 සහ 2A වශයෙන් ලකුණුකොට ඇති ඒකාබද්ධ ඉඩම් කොටසට මායිම්, උතුරට : පී. බී. කපුලියද්ද යන අයගේ දේපළ, නැගෙනහිරට : හරගම ලෙච්චමී වත්තේ කැළේ නොහොත් ඩඩන්පොළ වත්තේ කැළේ දැන් කොකෝ සහ ගම්මිරිස් තපොලමුදලිට අයිති දේපළ, දකුණට : කියාපුලියද්දේ රෙජිස්ට්‍රාර්ගේ දේපළ සහ බස්නාහිරට : තලාතුඔය සිට හේවාහැට දක්වා පාර යන මායිම් තුළ

පිහිටි ප්‍රමාණයෙන් අක්කර අටයි රූඩ් තුනයි පර්චස් විසි අටක් (අ. 8, රූ. 3, පර්. 28) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි, ජල පොම්පය සහ ඒ සී ජෙනරේටරය සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන්, ප්‍රවශ්‍යතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබන්ධයන් ද සමග වෙළුම/පත්‍රිරුව G 471/204 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්,

03 - 164

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කුරුණෑගල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

මොහොමඩ් යුසුෆ් මොහිදීන් මීරා සයිබු.

2016 ක් වූ ජනවාරි මස 29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. හේවාපතිරණ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2014 දෙසැම්බර් මස 19 වැනි දින සහතික කළ අංක 3927 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් යුසුෆ් මීරා සයිබු ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්පන් ලක්ෂ අසූනම දහස් පන්සීයයි ශත විසිඅට (රු. 55,89,500.28) ක මුදලක් 2015 නොවැම්බර් මස 30 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 55,89,500.28 ක මුදල අයකර ගැනීම සඳහා 2015 දෙසැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 3927 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ, තිරගන්දාහේ කෝරළේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 815 බමුණාවල ග්‍රාම නිලධාරි වසමේ බමුණාවල ග්‍රාමයේ පිහිටි "බවුණාවල වත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. බී. කළවානේගම විසින් පිළියෙල කරන ලද 2000 අප්‍රේල් මස 11 වැනි දින අංක 1580 දරන පිඹුරෙන් බෙදා වෙන්කොට ඇති ලොට් 1 සහ 2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස්වලට මායිම් වශයෙන්, උතුරට : ලොට් 03 වශනේ දැක්වෙන මීටර් 4.5ක් පළල පාර ද, නැගෙනහිරට : නවුෆර් සහ අනිකුත් අය හිමිකම් කියන ඉඩමෙන් සහ චන්ද්‍රිකා රත්නපාල හිමිකම් කියන ඉඩමෙන් ද, දකුණට : චන්ද්‍රිකා රත්නපාල හිමිකම් කියන ඉඩමෙන් ද සහ බස්නාහිරට : මීගමුව පාරේ සිට යන පාරෙන්ද මායිම් වූ පර්චස් තිහයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 30.5) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ, ගොඩනැගිලි සහ එහි පිහිටි අනෙකුත් සියලු දේත් සමග එකී පිඹුරේ පොදුවේ භාවිතවන මාර්ග අයිතිය සඳහා පාරක් සඳහා සළකුණු කරන ලද ලොට් 3 දරන ප්‍රවේශ මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 178/1

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - යාපනය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

කුමාරසාමි ජෙයන්තන්.

2016 ක් වූ ජනවාරි මස 29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

යාපනය ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සිවරාමසර්මා විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2013 නොවැම්බර් මස 15 වැනි දින සහතික කළ අංක 245 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කුමාරසාමි ජෙයන්තන් ණයකරු ලෙස කුමාරසාමි ජෙයන්තන්ගේ බිරිඳ වන පත්මප්‍රිය ජෙයන්තන් ඇයගේ ස්වාමිපුරුෂයාගේ කැමැත්තෙන් හා විශ්වාසයෙන් යුතුව ක්‍රියාකරමින් උකස්කරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි හතළිස් දහස් හත්සිය හැත්තෑ නමයයි ශත අනූව (රු. 2,00,40,779.90) ක මුදලක් 2015 ජූලි මස 21 වැනි දින විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 2,00,40,779.90ක මුදල අයකර ගැනීම සඳහා 2015 ජූලි මස 22 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 245 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යාපනය මහනගර සභා සීමාව තුළ වසම් අංක 18හි වන්නාරපන්නෙයි (ජේ/82) ග්‍රාම නිලධාරි වසමේ වන්නාරපන්නෙයි පත්තුවේ ඊසාන වන්නාරපන්නෙයි පිහිටි කේ. කේ. එස්. පාරේ වරිපනම් අංක 536, 538 සහ 540 දරන වෙඩ්ඩායිකරන් වලව් සහ අන්වාලන්ඩ් තාලව් නැමති විශාලත්වයෙන් ලාවම්ස් වි.සි. 5 විශාලත්වයෙන් යුතු ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එන්. කේ. නාගෙස්වරන් විසින් 2010 ඔක්තොබර් මස 05 වැනි දින සාදන ලද අංක 574 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 1 දරන ඉඩම් කොටසට මායිම් වශයෙන්, නැගෙනහිරට : සින්නතුරෙයිගේ බිරිඳ වන සරස්වතීට අයිති දේපළ සහ නවලර් පාසැලට අයිති දේපළද, උතුරට : වී. කේ. සුප්පයියා සහ සහෝදරයන්ට අයිති දේපළ ද, බස්නාහිරට : කේ. කේ. එස්. පාර සහ වී. කේ සුප්පයියා සහ සහෝදරයන්ට අයිති දේපල සහ අනිකුත් අයට අයිති දේපළ ද සහ දකුණට : අතුරු පටුමග සහ වැවලර් පාසලට අයත් දේපළෙන්ද මායිම් වූ අංක 574 දරන පිඹුර ප්‍රකාරව ලාවම් වරගු කල්වර් හතරයි කුලීස් දොළහයි දශම බිංදුව (04 එල්එම්එස් විසි සහ 12.0 කුලීස්) විශාලත්වයෙන් යුක්ත එහි ඇති ගොඩනැගිල්ල, ළිඳ, වගාවන් සහ ගහකොළ සහ සියලුම දේත් සමග වන අතර මෙය යාපනය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඩී 550/265 යටතේ ලියාපදිංචි වී ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඊ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 178/2

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ප්‍රධාන ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ෆැෂන් ලංකා ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2016ක් වූ ජනවාරි මස 29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් 2006 නොවැම්බර් මස 30 වැනි දින සහතික කළ අංක 2812 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ආර්. ද සිල්වා විසින් 2007 ජූලි මස 05 වැනි දින සහතික කළ අංක 2199 දරන හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ බැඳුම්කරයන් මගින් ෆැෂන් ලංකා ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු වශයෙන් හා දොන් ජයන්ත විජේමාන්න උකස්කරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙතින් ලබා ගත් ණය මුදල් සඳහා සුරැකුම් වශයෙන් මෙහි පළමුවන උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ දෙවැනි උපලේඛනයේ විස්තර කරන ලද මාර්ග අයිති සමග හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ෆැෂන් ලංකා ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත ප්‍රදානය කරන ලද ණය මුදල් වෙනුවෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොටස ඇති හෙයින් ද,

එසේ හෙයින් ඉහත කී දොන් ජයන්ත විජේමාන්න යන අය ෆැෂන් ලංකා ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ අත්‍යථ හිමිකම් සහ පාලනය දරන තැනැත්තා සහ එකී ෆැෂන් ලංකා ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සියලුම කොටස්වල හිමිකම් දරන ඒ තැනැත්තා සහ අධ්‍යක්ෂක වශයෙන් එකී දොන් ජයන්ත විජේමාන්න යන අය එම සමාගමේ පාලනය හා කළමනාකරණය දරන බැවින් ඒ අනුව හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ෆැෂන් ලංකා ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමට සැපයූ මූල්‍ය පහසුකම් වල නියම අර්ථලාභියා වනුයේ එකී දොන් ජයන්ත විජේමාන්න යන අය වන හෙයින් ද,

ෆැෂන් ලංකා ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ දොන් ජයන්ත විජේමාන්න යන අය හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ඉහත කී බැඳුම්කරයන් යටතේ ඇමෙරිකානු ඩොලර් එක්ලක්ෂ විසිහතරදහස් තුන්සිය අනූ අටයි ශත පනස් හයක් (ඇ.ඩො. 1,24,398.56) (ශ්‍රී ලංකා මුදලට සමතුල්‍ය වශයෙන්) රුපියල් එක්කෝටි හැටහත්ලක්ෂ තිස්හතරදහස් හත්සිය දහසයයි ශත විසි අටක (රු. 1,67,34,716.28)ක මුදලක් 2015 අගෝස්තු මස 31 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී (ඇ.ඩො. 1,24,398.56) (ශ්‍රී ලංකා මුදලට සමතුල්‍ය වශයෙන්) (රු. 1,67,34,716.28)ක මුදල අයකර ගැනීම සඳහා සහ 2015 සැප්තැම්බර් මස 01 වැනි දින සිට දේපල විකිණීමේ දිනය දක්වා වැඩිපුර පොළියද සමග ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 2812 සහ 2199 දරන උකස් බැඳුම්කරයන් යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි පළමුවන උපලේඛනයේ විස්තර කරනු ලබන දේපළ සමග දෙවන උපලේඛනයේ විස්තර කරන ලද මාර්ග අයිතිය සමග කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ අත්තිඩිය හි පිහිටි කවුඩාන පාරේ (කොටසක්) වරිපනම් අංක 75/3 දරන අත්තිඩියවෙල සහ වැටකෙයියාව කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. චන්ද්‍රදාස විසින් පිළියෙල කරන ලද 1994 ඔක්තෝබර් 29 වැනි දින සහ අංක 107/94 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : අඩි 30ක් පළල පාරෙන් ද, නැගෙනහිරට : ලොට් එල් 3 ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටසෙන් ද සහ බස්නාහිරට : අඩි 40ක් පළල පාරෙන් ද මායිම් වූ එකී අංක 107/94 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහසයයි දශම දෙකයි නමය (අ. 0, රූ. 0, පර්. 16.29)ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2549/63 යටතේ ලියාපදිංචි වී ඇත.

### දෙවන උපලේඛනය

(a) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ අංක 15 අත්තිඩිය හි පිහිටි අත්තිඩිය වෙල්යාය සහ වැටකෙයියාව කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඊ. විජේසූරිය විසින් පිළියෙල කරන ලද 1988 පෙබරවාරි මස 26 වැනි දින සහ අංක 1334 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 11 (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් 2, 3 සහ 4 ද, නැගෙනහිරට : කොටස, ඇළ සහ ලොට් 1 ද, දකුණට : ඇළ සහ ලොට් 14 ද සහ බස්නාහිරට : ලොට් 4 සිට 10 දක්වා මායිම් වූ එකී අංක 1334 දරන පිඹුර ප්‍රකාරව අක්කර එකයි රූඩ් එකයි පර්චස් විසිඑකයි දශම එක (අ. 1, රූ. 1, පර්. 21.1)ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2164/245 යටතේ ලියාපදිංචි වී ඇත.

(b) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ අංක 15 අත්තිඩිය හි පිහිටි අත්තිඩිය වෙල්යාය සහ වැටකෙයියාව කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඒ. විජේසූරිය විසින් පිළියෙල කරන ලද 1988 පෙබරවාරි මස 26 වැනි දින සහ අංක 1334 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 12 (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් 13 ද, නැගෙනහිරට : ලොට් 1, 4 සිට 11 දක්වා ද, දකුණට : ලොට් 2 සිට 4 දක්වා ද සහ බස්නාහිරට : ලොට් 13න්ද මායිම් වූ එකී අංක 1334 දරන පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි පර්චස් තිස් නමයයි දශම පහ (අ. 2, රූ. 0, පර්. 39.5)ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2164/246 යටතේ ලියාපදිංචි වී ඇත.

(c) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ වසම් අංක 15 අත්තිඩිය හි පිහිටි අත්තිඩිය වෙල්යාය සහ වැටකෙයියාව කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඒ. විජේසූරිය විසින් පිළියෙල කරන ලද 1988 පෙබරවාරි මස 26 වැනි දින සහ අංක 1334 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 1 (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : බොල්ගොඩ ඇල ද, නැගෙනහිරට : අත්තිඩිය පාර ද, දකුණට : ඇළ ද සහ බස්නාහිරට : ලොට් 21, 2 සහ 11න්ද මායිම් වූ එකී අංක 1334 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසිනමයයි දශම දෙක (අ. 0, රූ. 0, පර්. 29.2)ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2164/233 යටතේ ලියාපදිංචි වී ඇත.

(d) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ අංක 15 අත්තිඩිය හි පිහිටි අත්තිඩිය වෙල්යාය සහ වැටකෙයියාව කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඒ. විජේසූරිය විසින් පිළියෙල කරන ලද 1988 පෙබරවාරි මස 26 වැනි දින සහ අංක 1334 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 14 (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් 10 ද, නැගෙනහිරට : ඇළ ද, දකුණට : කවුඩාන පාර සහ බස්නාහිරට : ඇළෙන් ද මායිම් වූ එකී අංක 1334 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් විසිඑකයි දශම දෙක (අ. 0, රූ. 01 පර්. 21.2)ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2164/235 යටතේ ලියාපදිංචි වී ඇත.

(e) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ අංක 15 අත්තිඩිය හි පිහිටි අත්තිඩිය වෙල්යාය සහ වැටකෙයියාව කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඒ. විජේසූරිය විසින් පිළියෙල කරන ලද 1988 සැප්තැම්බර් මස 07 වැනි දින සහ අංක 1386 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් කේ (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් ජී සහ ජේ ද, නැගෙනහිරට : අංක 1334 දරන පිඹුරේ ලොට් 11 ද, දකුණට : ලොට් එල් ද සහ බස්නාහිරට : අංක 1334 දරන පිඹුරේ ලොට් 12න් ද මායිම් වූ එකී අංක 1386 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දාහතරයි දශම දෙක (අ. 0, රූ. 01 පර්. 14.2)ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2249/81 යටතේ ලියාපදිංචි වී ඇත.

(f) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ අංක 15 අත්තිඩිය හි පිහිටි අත්තිඩිය වෙල්යාය සහ වැටකෙයියාව කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඒ. විජේසූරිය විසින් පිළියෙල කරන ලද 1988 සැප්තැම්බර් මස 07 වැනි දින සහ අංක 1386 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් එම් (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් එච් ද, නැගෙනහිරට : අංක 1334 දරන පිඹුරේ ලොට් 11 ද, දකුණට : ලොට් එන්. ඕ. පී. කිව් ද සහ බස්නාහිරට : අංක 1334 දරන පිඹුරේ ලොට් 12න්ද මායිම් වූ එකී අංක 1386 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් දොළහයි දශම හතර (අ. 0, රූ. 1, පර්. 12.4)ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරුව එම් 2164/239 යටතේ ලියාපදිංචි වී ඇත.

(g) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල-ගල්කිස්ස නගර සභා සීමාව තුළ අංක 15 අත්තිඩිය හි පිහිටි අත්තිඩිය වෙල්යාය සහ වැටකෙයියාව කුඹුර නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. එස්. ඒ. විජේසූරිය විසින් පිළියෙල කරන ලද 1988 සැප්තැම්බර් මස 14 වැනි දින සහ අංක 1390 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් එල් 113 (පාරක් සඳහා වෙන් කරන ලද) වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන් උතුරට : ලොට් එල් 46, එල් 45, එල් 116, එල් 47, එල් 48, එල් 49, එල් 50, එල් 115, එල් 51, එල් 52, එල් 53, එල් 54, එල් 114, එල් 55, එල් 56, සහ එල් 58 ද, නැගෙනහිරට : අංක 1334 දරන පිඹුරේ ලොට් 11 ද, දකුණට : ලොට් එල් 59, එල්. 61, එල් 71 සහ එල් 72 ද සහ බස්නාහිරට : අංක 1334 දරන පිඹුරේ ලොට් 12න් ද මායිම් වූ එකී අංක 1390 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0 පර්. 20.5)ක විශාලත්වයෙන් යුතු බිම් කොටස වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2164/237 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 178/3

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දඹුල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

තෙන්නකෝන් මුදියන්සේලාගේ ශානක සම්පත් බණ්ඩාර සහ රත්නායක මුදියන්සේලාගේ නිරෝෂනී රත්නායක.

2016ක් වූ ජනවාරි මස 29 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. ආර්. පී. ගාල්ලගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි නමට ලියන ලද්දාවූ ද 2012 ජූලි මස 10 වැනි දින සහතික කළ අංක 1708 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තෙන්නකෝන් මුදියන්සේලාගේ ශානක සම්පත් බණ්ඩාර සහ රත්නායක මුදියන්සේලාගේ නිරෝෂනී රත්නායක ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්හය ලක්ෂ අනූඅට දහස් හත්සිය දහනමයයි ශත හැත්තෑ නමය (රු. 56,98,719.79) ක මුදලක් 2015 ඔක්තෝබර් මස 31 වැනි දින විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු හා ලැබිය යුතුව ඇති හෙයින් ද එකී රු. 56,98,719.79ක මුදල අයකර ගැනීම සඳහා 2015 නොවැම්බර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 1708 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද

ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

## උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උතුරු මාතලේ, වගපනහ පල්ලේසිය පත්තුවේ, දඹුල්ල මහනගර සභා සීමාව තුළ හලුඅපුල්ලනවැව අලුත්වත්ත ගමේ හි පිහිටි "මීන්නේරියාය" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් පිළියෙල කරන ලද 2010ක් වූ දෙසැම්බර් මස 02 වැනි දින සහ අංක 5080 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් "ඒ" වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වී. ජී. ආනන්ද ජයරත්න හිමිකම් කියන බලයලත් මිනින්දෝරු අනුරරත්න විසින් සාදන ලද අංක 3063 දරන පිඹුරේ ලොට් 01 දරන බිම් කොටසින් ද, නැගෙනහිරට : වී. ජී. ආනන්ද ජයරත්න හිමිකම් කියන බලයලත් මිනින්දෝරු අනුරරත්න විසින් සාදන ලද අංක 3063 දරන පිඹුරේ ලොට් 01 දරන බිම් කොටසින් ද, දකුණට : උසාවිය හංදියේ සිට නිවාසවලට යන පාරෙන් ද සහ බස්නාහිරට : වී. ජී. ආනන්ද ජයරත්න හිමිකම් කියන බලයලත් මිනින්දෝරු අනුරරත්න විසින් සාදන ලද අංක 3063 දරන පිඹුරේ ලොට් 01 දරන බිම් කොටසින් ද මායිම් වූ පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගහකොළ සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

03 - 178/4

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2016** | | | | | |
| **මාර්තු** | 2016.03.04 | සිකුරාදා | 2016.02.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.11 | සිකුරාදා | 2016.02.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.18 | සිකුරාදා | 2016.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.03.24 | බ්‍රහස්පතින්දා | 2016.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2016.04.01 | සිකුරාදා | 2016.03.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.04.08 | සිකුරාදා | 2016.03.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2016.04.15 | සිකුරාදා | 2016.04.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.04.22 | සිකුරාදා | 2016.04.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.04.29 | සිකුරාදා | 2016.04.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2016.05.06 | සිකුරාදා | 2016.04.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.13 | සිකුරාදා | 2016.04.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.20 | සිකුරාදා | 2016.05.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.05.27 | සිකුරාදා | 2016.05.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
*රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.